## ශ්‍රී ලංකා
## ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
## පාර්ලිමේන්තුව

---

# 1994 අංක 19 දරන
# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
# කොමිෂන් සභා පනත

---

**[සහතිකය සටහන් කළේ 1994 ඔක්තෝබර් මස 27 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1994 ඔක්තෝබර් මස 28 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

මිළ : රු. 12.00 යි.     තැපැල් ගාස්තුව : රු. 4.60 යි.

# 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත

(සහතිකය සටහන් කළේ 1994 ඔක්තෝබර් මස 27 වන දින)

එල්. ඩී.—ඕ 49/94

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමට සහ අල්ලස් පනත හා ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ වැරදි සම්බන්ධයෙන් නඩු පවරන ලෙස විධාන කිරීමට ස්ථිර කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින් මතු " නියමිත දිනය " යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය. — *පූර්ණ නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

2. (1) මේ පනතේ මීන් ඉදිරියට ඇති විධිවිධානවලට අනුකූලව අල්ලස් හෝ දූෂණ පිළිබඳව කොමිෂන් සභාව වෙත කරනු ලබන චෝදනා විමර්ශනය කිරීම සහ අල්ලස් පනත හා ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ වැරදි සම්බන්ධයෙන් නඩු පවරන ලෙස විධාන කිරීම සඳහා, (මෙහි මින් මතු " කොමිෂන් සභාව " යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවක්, මේ පනතේ කාර්ය සඳහා පිහිටුවනු ලැබිය යුතු ය. — *අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව.*

(2) (අ) කොමිෂන් සභාව, සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත විය යුතු ය. ඔවුන් අතුරින් සාමාජිකයන් දෙදෙනකු විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ හෝ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයන් විය යුතු අතර, එක් සාමාජිකයකු අපරාධ විමර්ශනයට සහ නීතිය ක්‍රියාත්මක කිරීමට අදාළව පුළුල් පළපුරුද්දක් ඇති තැනැත්තකු විය යුතු ය.

(ආ) කොමිෂන් සභාවේ සාමාජිකයන් ආණ්ඩුක්‍රම සභාවේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, නියමිත දිනයෙන් ආරම්භව, ආණ්ඩුක්‍රමික සභාව පිහිටුවනු ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව ඇතුළත, කොමිෂන් සභාවේ සාමාජිකයන්, කථානායකවරයා විමසා අග්‍රාමාත්‍යවරයා විසින් කරනු ලබන නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(3) විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකු හෝ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු වන්නා වූ කොමිෂන් සභාවේ එක් සාමාජිකයකු ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාවේ සාමාජිකයකු විසින් තත් කාර්යය සඳහා ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින්, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) (අ) කොමිෂන් සභාවේ සාමාජිකයකු ඉවත් කිරීම සඳහා, ඔප්පු වී ඇති විෂමාචාරය හෝ අශක්‍යතාව පදනම් කොට ගෙන (නොපැමිණි මන්ත්‍රීවරයන්ද ඇතුළුව) පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් බහුතර සංඛ්‍යාවක් විසින් සම්මත කරන ලද පාර්ලිමේන්තු යෝජනාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබීමෙන් පසුව ජනාධිපතිවරයා විසින් කරන ලද නියමයකින් හැර, ඒ සාමාජිකයකු ඉවත් කළ නොහැකි විය යුතු ය :

එසේ වුව ද, එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා වූ යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම, පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් යටත් පිරිසෙයින් තුනෙන් එකක් විසින් අත්සන් තබා ඇත්නම් හා චෝදිත විෂමාචාරය හෝ අශක්‍යතාව පිළිබඳ සම්පූර්ණ විස්තර එහි දක්වා ඇත්නම් මිස, කථානායකවරයා විසින්, එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා වූ කිසිම යෝජනා සම්මතයක් භාර ගැනීම හෝ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම හෝ නොකළ යුතු ය.

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු ඉවත් කිරීම සඳහා වූ පාර්ලිමේන්තුවේ යෝජනාවක් ඉදිරිපත් කිරීමේ හා සම්මත කිරීමේ කාර්ය පටිපාටිය, කොමිෂන් සභාවේ සාමාජිකයකු ඉවත් කිරීම සඳහා පාර්ලිමේන්තුවේ යෝජනාවක් ඉදිරිපත් කිරීම හා සම්මත කිරීම සම්බන්ධයෙන්, සියලු ආකාරයෙන් අදාළ විය යුතු ය.

(6) කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු ම, ඔහු මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය හිස් කළහොත් මිස, අවුරුදු පහක කාලයක් ධුරය දැරිය යුතු අතර, නැවත පත් කරනු ලැබීම සඳහා නුසුදුසු විය යුතු ය :

එසේ වුවද, මියයන, ධුරයෙන් ඉල්ලා අස්වන හෝ ධුරයෙන් ඉවත් කරනු ලබන සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයකුගේ ධුර කාලය, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය විය යුතු ය.

(7) කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ වැටුප් පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, ඒ වැටුප් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු ය. තවද ඒ වැටුප් ඒ සාමාජිකයන්ගේ ධුර කාලය ඇතුළත අඩු කරනු නොලැබිය යුතු ය.

(8) කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල, කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් එක්ව අසුන් ගැනීමෙන් හෝ වෙන වෙනම අසුන් ගැනීමෙන් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාවේ සාමාජිකයකු විසින් වෙනම අසුන් ගෙන එවැනි යම් බලයක් ක්‍රියාත්මක කරනු ලබන අවස්ථාවක, ඔහුගේ ක්‍රියා කොමිෂන් සභාවේ ක්‍රියා ලෙස සලකනු ලැබිය යුතු ය.

## II වන කොටස

3. කොමිෂන් සභාව විසින්, මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාව වෙත 4 වන වගන්තිය යටතේ එවන දැනුම් දීම්වල අන්තර්ගත චෝදනා විමර්ශනය කිරීම සහ එවැනි යම් විමර්ශනයක දී අල්ලස් පනත යටතේ හෝ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ හෝ යම් තැනැත්තකු විසින් යම් වරදක් සිදු කරන ලද බව හෙළිදරව් වන අවස්ථාවක ඒ වරද සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව නිසි අධිකරණයෙහි නඩු පවරන ලෙස විධාන කිරීම, කළ යුතු ය.

කොමිෂන් සභාවේ කාර්යය.

4. (1) කොමිෂන් සභාව වෙත කරන දැනුම්දීමක් මගින් යම් තැනැත්තකුට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනාවක්, (ඒ අල්ලස හෝ දූෂණය සංයුක්ත වන ක්‍රියාව ඒ තැනැත්තා විසින් කරන ලදැයි කියනු ලබන්නේ යම් ධූරයක් හෝ සේවානියුක්තියක් දැරීම ප්‍රකාරව ද, දැනුම් දීම කොමිෂන් සභාව වෙත ලැබුණු දිනයේ දී ඒ තැනැත්තා ඒ ධූරය හෝ සේවානියුක්තිය දරමින් සිටිය ද නොසිටිය ද කරනු ලැබිය හැකිය ; තැනැත්තෙකු කොමිෂන් සභාව වෙත කරන දැනුම් දීමක් මගින්, යම් තැනැත්තකු විසින්, වෙනත් යම් තැනැත්තකු මෑතක දී කළ යම් ධනය නැතහොත් දේපළ අත්කර ගැනීමක් හෝ මුදල් හෝ ව්‍යාපාරික ගනුදෙනු හෝ මෑතක දී කළ වියදම් කිසිවක් හෝ සම්බන්ධයෙන් (ඒ දැනුම් දීම කොමිෂන් සභාව වෙත ලැබුණු දිනයේ දී ඒ වෙනත් තැනැත්තා ඒ ධූරය හෝ සේවානියුක්තිය දරමින් සිටිය ද නොසිටිය ද) ඒ අත්කර ගැනීම, ගනුදෙනු හෝ වියදම, දැනුම් දීම කරන තැනැත්තාගේ දැනීම අනුව, ඒ වෙනත් තැනැත්තාගේ ප්‍රකට ධන හෝ ආදායම් ප්‍රභවයන් හා නොගැළපෙන විට, කොමිෂන් සභාවේ අවධානය ඊට යොමු කිරීම, කළ හැකි ය.

කොමිෂන් සභාව වෙත දැනුම් දීම.

(2) (1) වන උපවගන්තිය යටතේ දැනුම් දීමක් ලැබුණු විට, ඒ දැනුම් දීම නිර්ව්‍යාජ බවට සහ විමර්ශනයක් පැවැත්විය යුතු කරුණු ඒ දැනුම් දීමෙන් අනාවරණය වන බවට කොමිෂන් සභාව සෑහීමට පත් වන්නේ නම්, මෙහි පහත සඳහන් සියලු කාරණා හෝ ඉන් යම් කාරණයක්, එනම්—

(අ) අල්ලස් පනතේ හෝ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ හෝ විධිවිධාන යටතේ නඩු පැවරීම හෝ වෙනත් යෝග්‍ය ක්‍රියා මාර්ගයක් ගැනීම ; හෝ

(ආ) වෙනත් යම් නීතියක් යටතේ නඩු පැවරීම,

පිළිබඳ තීරණයට එළඹීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි යම් විමර්ශනයක් කොමිෂන් සභාව විසින් පවත්වනු ලැබිය යුතු අතර, කොමිෂන්

සභාව වෙත ලැබුණු දැනුම් දීමක් සම්බන්ධයෙන්, වෙනත් යම් බලධරයකු විසින් කටයුතු කළයුතු යයි විමර්ශනයක් පැවැත්වීමට පෙර වුව ද පසුව වුව ද කොමිෂන් සභාව තීරණය කරන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් ඒ දැනුම් දීම ඒ බලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත ලැබුණු දැනුම් දීමකින් අනාවරණය වන යම් කාරණා, නියමිත දිනයට පෙරාතුව වූ කාලයකට අදාළ වුව ද නොවුව ද, එමෙන්ම වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඒ නොතකා ඒ කවර හෝ කාරණයක් පිළිබඳව විමර්ශනය කිරීමට, කොමිෂන් සභාවට බලය තිබිය යුතු ය.

කොමිෂන් සභාවේ බලතල.

5. (1) කොමිෂන් සභාව වෙත මේ පනතින් පැවරී ඇති කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා මෙහි පහත දැක්වෙන බලතල කොමිෂන් සභාවට තිබිය යුතු ය :—

(අ) ලබා ගැනීමට අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි කොමිෂන් සභාව කල්පනා කරන සියලු ලිඛිත හෝ වාචික සාක්ෂි ලබා ගැනීම හා භාර ගැනීම සහ ප්‍රශ්න කරනු ලැබීමට අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි කොමිෂන් සභාව කල්පනා කරන සියලු තැනැත්තන්ගෙන් ප්‍රශ්න කිරීම ;

(ආ) යම් තැනැත්තකුට, කොමිෂන් සභාව විසින් ප්‍රශ්න කරනු ලැබීමේ කාර්ය සඳහා කොමිෂන් සභාව හමුවට පැමිණෙන ලෙස සහ විමර්ශනය කරනු ලබන කාරණාවලට, කොමිෂන් සභාවේ මතය අනුව අදාළ වන කොමිෂන් සභාව විසින් ඔහුගෙන් අසනු ලබන යම් ප්‍රශ්නයකට දිවුරුම් හෝ ප්‍රතිඥා පිට වාචිකව පිළිතුරු දෙන ලෙස නැතහොත් විමර්ශනය කරනු ලබන කාරණාවලට අදාළ යම් කරුණු දිවුරුම් ප්‍රකාශයක් මගින් ප්‍රකාශ කරන ලෙස නියම කිරීම ;

(ඇ) තම සන්තකයෙහි හෝ පාලනයෙහි තිබෙන යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම සඳහා යම් තැනැත්තකු කැඳවීම ;

(ඈ) 4 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් දැනුම් දීමක් ලැබී ඇද්ද, ඒ තැනැත්තාගේ හෝ ඒ තැනැත්තාගේ ස්වාමිපුරුෂයාගේ/භාර්යාවගේ නැතහොත් පුතකුගේ හෝ දූවකගේ හෝ ඒ තැනැත්තා අධ්‍යක්ෂවරයකු වන සමාගමක, ඒ තැනැත්තාට වැඩදායී සම්බන්ධතාවක් ඇති භාරයක හෝ ඒ තැනැත්තා හවුල්කරුවකු වන ව්‍යාපාර ආයතනයක ගිණුමට අදාළ සටහන් ඇතුළත් බැංකුවේ යම් පොතක්, ලේඛනයක් හෝ චෙක්පතක් දැන්වීමෙහි සඳහන් යම් කාලයක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස නැතහොත් ඒ පොතේ, ලේඛනයේ හෝ චෙක්පතේ හෝ එහි යම් සටහනක සහතික පිටපත්, දැන්වීමෙහි සඳහන් පරිදි, සපයන ලෙස යම් බැංකුවක කළමනාකාරවරයාට ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබූ ලිඛිත දැන්වීමක් මගින් විධාන කිරීම ;

(ඉ) 4 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් දැනුම් දීමක් ලැබී ඇද්ද, ඒ තැනැත්තාගේ හෝ ඒ තැනැත්තාගේ ස්වාමිපුරුෂයාගේ/භාර්යාවගේ නැතහොත් පුතකුගේ හෝ දුවකගේ හෝ කටයුතුවලට අදාළව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඇති සියලු තොරතුරු දන්වීමෙහි සඳහන් පරිදි සපයන ලෙස සහ ඒ කොමසාරිස් ජනරාල්වරයාගේ සන්තකයේ හෝ පාලනය යටතේ ඇති ඒ තැනැත්තාට, ස්වාමි පුරුෂයාට/භාර්යාවට, පුතාට හෝ දුවට අදාළ වන්නා වූ යම් ලේඛනයක් හෝ යම් ලේඛනයක සහතික පිටපතක් හෝ දන්වීමෙහි සඳහන් පරිදි ඉදිරිපත් කරන ලෙස හෝ සපයන ලෙස ඒ කොමසාරිස් ජනරාල්වරයාට ලියවිල්ලකින් වූ දන්වීමක් මගින් විධාන කිරීම ;

(ඊ) ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක්, කාර්යාලයක් හෝ ආයතනයක් භාරව සිටින තැනැත්තකුට හෝ යම් පළාත් පාලන ආයතනයක, පළාත් සභාවක, උපලේඛනගත ආයතනයක හෝ කොටස් වලින් සියයට පණහකට වැඩි ප්‍රමාණයක් ආණ්ඩුවට අයත් සමාගමක නගරාධිපතිවරයාට, හෝ සභාපතිවරයාට, හෝ අධිපතිවරයාට හෝ කවර හෝ තනතුරු නාමයකින් හඳුන්වනු ලැබුව ද ප්‍රධාන විධායක නිලධරයාට ඔහු සන්තකයේ හෝ පාලනය යටතේ තිබෙන යම් පොතක්, රෙජිස්ටරයක්, වාර්තාවක් හෝ ලේඛනයක් හෝ ඒවායේ සහතික පිටපත් හෝ ඒවායේ ඇති යම් සටහනක සහතික පිටපත් ඉදිරිපත් කරන ලෙස හෝ සපයන ලෙස ලියවිල්ලකින් වූ දන්වීමක් මගින් විධාන කිරීම ;

(උ) 4 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් දැනුම් දීමක් ලැබී ඇත් ද, ඒ තැනැත්තාට—

(i) ඒ තැනැත්තා සහ ඒ තැනැත්තාගේ ස්වාමිපුරුෂයා/භාර්යාව, පුතකු හෝ දුවක විසින් කවර හෝ අවස්ථාවක හෝ කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන යම් අවස්ථාවක අයත්ව හෝ ඔහු සන්තකව තිබූ සියලු චංචල හෝ නිශ්චල දේපළ ගෙන හැර දැක්වෙන සහ ඒ එක් එක් දේපළ මිළ දී ගැනීමෙන්, තෑගි ලැබීමෙන්, රික්ථවරණයෙන් උරුමවීමෙන් හෝ අන්‍යාකාරයකින් හෝ වුව ද අත්කර ගනු ලැබූ දිනය සඳහන් කෙරෙන ;

(ii) කොමිෂන් සභාවේ මතය අනුව විමර්ශනයට අදාළ වෙනත් යම් කාරණා පිළිබඳ විස්තර ඇතුළත්

දිවුරුම්පිට කරන ලද ලියවිල්ලකින් වූ ප්‍රකාශයක් සපයන ලෙස විධාන කිරීම ;

(ඌ) වෙනත් යම් තැනැත්තකුට—

(i) කවර හෝ අවස්ථාවක හෝ කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන යම් අවස්ථාවක ඒ තැනැත්තාට අයත්ව හෝ සන්තකව තිබූ සියලු චංචල හෝ නිශ්චල දේපළ පිළිබඳ යම් තොරතුරු කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විමර්ශනවල දී උපකාරයක් විය හැකි බව විශ්වාස කිරීමට කොමිෂන් සභාවට යුක්ති සහගත හේතු පවත්නා අවස්ථාවක, ඒ චංචල හෝ නිශ්චල දේපළ පිළිබඳ තොරතුරු දැක්වෙන ;

(ii) කොමිෂන් සභාවේ මතය අනුව විමර්ශනයට අදාළ වෙනත් යම් කාරණා පිළිබඳ විස්තර ඇතුළත්

දිවුරුම් පිට කරන ලද ලියවිල්ලකින් වූ ප්‍රකාශයක් සපයන ලෙස විධාන කිරීම ;

(උ) 4 වන වගන්තිය යටතේ දැනුම් දීමක් ලැබී ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාට, ඒ තැනැත්තාගේ ස්වාමි පුරුෂයාට/භාර්යාවට, පුතාට හෝ දුවට හෝ ඒ පළමු සඳහන් තැනැත්තා වෙනුවෙන් භාරයක් වශයෙන් යම් දේපළක් දරන වෙනත් යම් තැනැත්තකුට හෝ ඔහු අධ්‍යක්ෂවරයකු වන සමාගමක්ට හෝ ඔහු හවුල්කරුවකු වන ව්‍යාපාර ආයතනයකට ලිඛිත නියමයක් මගින්, ඒ නියමයෙහි සඳහන් යම් චංචල හෝ නිශ්චල දේපළක අයිතිය හෝ ඒ දේපළකට ඇති යම් සම්බන්ධතාවක්, ඒ නියමය කොමිෂන් සභාව විසින් ප්‍රකාශාදිෂ්ට කරන තෙක් පැවරීම තහනම් කිරීම ; සහ නිශ්චල දේපළ සම්බන්ධයෙන් වන විට ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා ද, මෝටර් වාහන සම්බන්ධයෙන් වන විට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා ද යම් සමාගමක, කොටස්, ස්කන්ධ හෝ ණය පත්‍ර සම්බන්ධයෙන් වන විට සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සහ අදාළ සමාගමේ ලේකම්වරයා ද ඇතුළුව, සුදුසු යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන යම් බලධරයකු වෙත එම ලිඛිත නියමයේ පිටපතක් භාරදීමට සැලැස්වීම ;

(ඌ) (එ) ඡේදය යටතේ කරන ලද ලිඛිත නියමයක පිටපතක් භාර දී ඇත්තේ යම් බලධරයකු වෙත ද, ඒ පිටපත ඒ බලධරයා විසින් පවත්වාගෙන යනු ලබන යම් ලේඛනයක හෝ වාර්තාවක ලියාපදිංචි කරන ලෙස හෝ අනුගත කරන ලෙස ඒ බලධරයාට ලිඛිත නියමයක් මගින් නියම කිරීම ;

(ඍ) 4 වන වගන්තිය යටතේ දැනුම් දීමක් ලැබී ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාගේ විදේශ ගමන් බලපත්‍රය සහ වෙනත් ගමන් ලේඛන, ආගමන හා විගමන පාලකවරයා වෙත කරනු ලබන ලිඛිත නියමයක් මගින් ඒ ලිඛිත නියමයෙහි සඳහන් කරනු ලබන මාස තුනක් නොඉක්මවන යම් කාලයක් සඳහා පරිරෝධ කරන ලෙස ඒ පාලක වරයාට නියම කිරීම ;

(ඕ) යම් පොලිස් නිලධරයකු වෙත නමින් හෝ තිලයෙන් සඳහන් කර කරනු ලබන ලිඛිත නියමයක් මගින්, ඒ නියමයෙහි සඳහන් කරනු ලබන මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා, 4 වන වගන්තිය යටතේ දැනුම් දීමක් ලැබී ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් බැහැර යාම වැළැක්වීම පිණිස අවශ්‍ය සියලු පියවර ගන්නා ලෙස, ඒ පොලිස් නිලධරයාට නියම කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත පවරන ලද යම් බලයක් කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කළ හැකි අතර, ඒ බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා කොමිෂන් සභාව විසින් යම් තැනැත්තකුට විධානයක් නිකුත් කරනු ලබන්නේ ද ඒ තැනැත්තා විසින්, වෙනත් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඒ විධානය අනුව ක්‍රියා කළ යුතු ය.

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ කරන ලද වත්කම් හා බැරකම් ප්‍රකාශ පිරික්සීමට කොමිෂන් සභාවට අයිතිය ඇති බව.

6. ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත අදාළ වන තැනැත්තකු විසින්, ඒ පනත යටතේ කරන ලද යම් ප්‍රකාශයක් කැඳවීමට සහ එය පිරික්සීමට ඒ පනතේ පටහැනිව කුමක් සඳහන් වුවද, කොමිෂන් සභාවට අයිතිය තිබිය යුතු ය. තවද ඒ පනතේ 4 වන වගන්තිය යටතේ වත්කම් හා බැරකම් ප්‍රකාශයක් කර ඇත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාට ඒ ප්‍රකාශය කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබූ අවස්ථාවක ඒ තැනැත්තා විසින් ඒ නියමය අනුව ක්‍රියා කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

කොමිෂන් සභාව විසින් සෝදිසි කිරීමට බලය දිය හැකි බව.

7. (1) (අ) අල්ලස් පනත හෝ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ වරදක් සිදුකර ඇති බව සහ ඒ වරද සිදු කිරීම පිළිබඳ සාක්ෂි යම් ස්ථානයක හෝ යම් යාත්‍රාවක, වාහනයක හෝ ගුවන් යානයක හෝ යම් තැනැත්තකු වෙත හෝ ඇතැයි සැක කිරීමට යුක්ති සහගත හේතු පවතින බවට; හෝ

(ආ) මේ පනත යටතේ පවත්වනු ලබන යම් විමර්ශනයක් අතරතුර ඉදිරිපත් කළ යුතුව තිබුණු හා එසේ ඉදිරිපත් කරනු නොලැබූ පොත්පත්, ගිණුම් වෙනත් ලේඛන හෝ දේ කිසිවක් ඒ ස්ථානයෙහි හෝ එවැනි යම් වාහනයක, යාත්‍රාවක හෝ ගුවන් යානයක හෝ එවැනි තැනැත්තකු වෙත තිබෙන බවට

කොමිෂන් සභාව සෑහීමට පත් වන්නේ නම්, ඒ ස්ථානයට හෝ අවස්ථාවෝචිත පරිදි ඒ වාහනය, යාත්‍රාව හෝ ගුවන් යානය හෝ තිබිය හැකි හෝ තැනැත්තා සිටිය හැකි කවර හෝ ස්ථානයකට ඇතුළු වී, ඒ ස්ථානය හෝ අවස්ථාවෝචිත පරිදි ඒ වාහනය, යාත්‍රාව, ගුවන් යානය හෝ

තැනැත්තා සෝදිසි කරන ලෙස, කොමිෂන් සභාව විසින් ලිඛිත නියමයක් මගින් කොමිෂන් සභාවට සහාය වීම පිණිස පත් කරන ලද නිලධරයකුට බලය දිය හැකි ය.

(2) කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ බලය දෙන ලද නිලධරයකු විසින්, ඒ ස්ථානයෙහි හෝ වාහනයේ, යාත්‍රාවේ හෝ ගුවන් යානයේ හෝ තැනැත්තා වෙත හෝ තිබී සොයා ගනු ලබන්නා වූ ද, අල්ලස් පනත හෝ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේවූ වරදක් කිරීම සම්බන්ධයෙන් සාක්ෂියක් බව විශ්වාස කිරීමට ඔහුට යුක්ති සහගත හේතු ඇත්තා වූ ද, යම් භාණ්ඩයක් හෝ මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන යම් විමර්ශනයක දී ඉදිරිපත් කළ යුතුව තිබුණු බව විශ්වාස කිරීමට ඔහුට යුක්ති සහගත හේතු ඇති පොත්පත්, ගිණුම්, ලේඛන හෝ දේවල් කිසිවක් ඔහු විසින් තහනමට ගනු ලැබිය හැකි අතර, මේ වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර ඒ නිලධරයා විසින් තහනමට ගනු ලබන සෑම භාණ්ඩයක්, පොතක්, ගිණුමක්, ලේඛනයක් හෝ දෙයක් ම ඔහු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ වගන්තිය යටතේ සෝදිසි කිරීමක දී, ස්ත්‍රියක විසින් හැර කිසිම ස්ත්‍රියක් සෝදිසි කරනු නොලැබිය යුතු ය.

(3) මේ වගන්තිය ප්‍රකාර යම් ස්ථානයකට, යාත්‍රාවකට, වාහනයකට හෝ ගුවන් යානයකට ඇතුළුවීමට යම් තැනැත්තකුට යම් බලයක් තිබෙන විට, ඒ බලය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා යුක්ති සහගතව අවශ්‍ය විය හැකි යම් බලයක් ඔහු විසින් යොදනු ලැබිය හැකි ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ කොමිෂන් සභාව විසින් බලය දෙන ලද නිලධරයකු විසින්, අවශ්‍ය විය හැකි සහාය ද ඇතිව ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවකට, කාර්යාලයකට හෝ ආයතනයකට ඇතුළු වී ඒ දෙපාර්තමේන්තුව, කාර්යාලය හෝ ආයතනය සෝදිසි කළ හැකි ය.

(5) අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ කොමිෂන් සභාවට සහායවීම පිණිස පත් කරන ලද යම් නිලධරයකු විසින්, මේ පනත යටතේ ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා හෝ කර්තව්‍ය ඉටුකිරීමෙහි ලා සහාය වන ලෙස යම් රජයේ නිලධරයකුගෙන් හෝ වෙනත් යම් තැනැත්තකුගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

සිතාසි. 8. (1) කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන සෑම සිතාසියක් ම, කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අත්සන යටතේ විය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලබන සෑම සිතාසියක් ම එහි නම සඳහන් තැනැත්තා වෙත ගෙන ගොස් භාරදීමෙන් හෝ එසේ කළ නොහැකි නම්, එය ඒ තැනැත්තාගේ අන්තිමට දැන සිටි වාසස්ථානයෙහි තැබීමෙන් හෝ භාර දෙනු ලැබිය හැකි ය.

(3) සිතාසියක් භාර දෙනු ලැබූ සෑම තැනැත්තකු ම, ඒ සිතාසියේ සඳහන් වේලාවේ දී සහ ස්ථානයේ දී කොමිෂන් සභාව ඉදිරියෙහි පෙනී සිටිය යුතු අතර, කොමිෂන් සභාව විසින් ඔහුගෙන් අසනු ලැබිය හැකි යම් ප්‍රශ්නයකට උත්තර දීම හෝ ඉදිරිපත් කරන ලෙස ඔහුට සිතාසියෙහි නියම කර ඇති ලේඛන හෝ වෙනත් දේ ඉදිරිපත් කිරීම කළ යුතු ය.

(4) කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන සෑම සිතාසියක් ම, ග්‍රාම නිලධාරියකු විසින් හෝ කොමිෂන් සභාවට සහාය වීම සඳහා පත් කරන ලද නිලධරයකු හෝ සේවකයකු විසින් භාර දී ක්‍රියාවෙහි යොදවනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව ඉදිරියෙහි පෙනී සිටින තැනැත්තන් සතු වරප්‍රසාද හා පරිහාර.

9. (1) කොමිෂන් සභාවට හෝ කොමිෂන් සභාව ඉදිරියේ කරන ලද යම් ප්‍රකාශයක් හෝ දෙන ලද තොරතුරු හෝ උත්තරයක් සම්බන්ධයෙන් නැතහොත් ඉදිරිපත් කරන ලද ලේඛනයක් හෝ වෙනත් දෙයක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු යම් අධිකරණයක දී සිවිල් වූ හෝ අපරාධ වූ හෝ යම් නඩුවකට, නඩු පැවරීමකට හෝ වෙනත් නඩු කටයුත්තකට යටත් නොවිය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාවට හෝ කොමිෂන් සභාව ඉදිරියේ කරන ලද ප්‍රකාශයක් හෝ දෙන ලද උත්තරයක් හෝ තොරතුරක් පිළිබඳ සාක්ෂි යම් අධිකරණයක දී සිවිල් වූ හෝ අපරාධ වූ හෝ යම් නඩුවක දී, නඩු පැවරීමක දී හෝ වෙනත් නඩු කටයුත්තක දී ඒ තැනැත්තාට විරුද්ධව ආවේශ කර ගනු නොලැබිය යුතු ය:

එසේ වුව ද මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කිසිවකින්—

(i) මේ පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ XI වන පරිච්ඡේදය යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු යම් නඩුවකට, නඩු පැවරීමකට හෝ දණ්ඩනයට යටත් වීමට උනා නොවිය යුතු ය ; නැතහොත් ඒ යටත් වීම කෙරෙහි බලනොපෑ යුතු ය ; නැතහොත් ඒ යටත්වීම උනා වේ යයි හෝ ඒ කෙරෙහි බලපාන්නේ යයි සලකනු නොලැබිය යුතු ය ; නැතහොත් එසේ වන්නේ යයි තේරුම් ගනු නොලැබිය යුතු ය ;

(ii) එවැනි යම් නඩුවක හෝ නඩු පැවරීමක කාර්ය සඳහා යම් තැනැත්තකුගේ නම හෝ ඔහු විසින් කරන ලද ප්‍රකාශය හෝ ප්‍රකාශයෙහි යම් කොටසක් හෝ පළ කිරීම හෝ අනාවරණය කිරීම තහනම් කරනු නොලැබිය යුතු ය ; නැතහොත් ඒ පළ කිරීම හෝ අනාවරණය කිරීම තහනම් කරනු ලබන්නේ යයි සලකනු නොලැබිය යුතු ය ; නැතහොත් එසේ වන්නේ යයි තේරුම් ගනු නොලැබිය යුතු ය ; නැතහොත්

(iii) 15 වන වගන්තිය යටතේ ආවේශ්‍ය කරගත හැකි යම් ප්‍රකාශයක ආවේශ්‍යකභාවය කෙරෙහි බල නොපෑ යුතු ය.

**ගාස්තු සහ වෙනත් වියදම්.**

10. (1) මේ පනත යටතේ වූ යම් විමර්ශනයක් අවසන් වූ විට, ඒ විමර්ශනයට පාත්‍ර වූ කාරණයෙහි ලා යම් ආකාරයකින් විෂය වූ හෝ සම්බන්ධ යම් තැනැත්තකුට හෝ කොමිෂන් සභාව විසින් ඒ විමර්ශනය සම්බන්ධයෙන් නිකුත් කරන ලද දැන්වීමකට අනුකූලව ක්‍රියා කර ඇති යම් බැංකු කළමනාකරුවකු අයත් බැංකුවකට, ඒ විමර්ශනය සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් හෝ බැංකුව විසින් සාධාරණ ලෙස දරන ලද ගාස්තු හා වියදම් පියවීම පිණිස ප්‍රමාණවත් යයි කොමිෂන් සභාව සලකන යම් මුදල් ප්‍රමාණයක් කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ප්‍රදානය කරන සියලු මුදල්, තත් කාර්යය සඳහා විසර්ජනය කරන මුදලින් රජය විසින් ගෙවනු ලැබිය යුතු ය.

**ඇතැම් අවස්ථාවල දී අපරාධ නඩු පවරන ලෙස කොමිෂන් සභාව විසින් විධාන කළ යුතු බව.**

11. කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ පවත්වන ලද විමර්ශනයක දී කොමිෂන් සභාව වෙත ලැබුණු කරුණු වලින්, යම් තැනැත්තකු විසින් අල්ලස් පනත යටතේ හෝ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ කරන ලද වරදක් සිදු කර ඇති බව අනාවරණය වන අවස්ථාවක, ඒ තැනැත්තාට විරුද්ධව නිසි අධිකරණයෙහි අපරාධ නඩු කටයුතු පවරන ලෙස කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට විධාන කළ යුතු අතර, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඒ අනුව නඩු කටයුතු පවරනු ලැබිය යුතු ය :

එසේ වුවද, කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන යම් විමර්ශනයක දී කොමිෂන් සභාවට දැනගන්නට ලැබෙන කරුණුවලින් අල්ලස් පනතේ 11 වන කොටස යටතේ වරදක් හෙළිදරව් වන්නා වූ ද, තුටුපඬුර හෝ වටිනාකම රුපියල් දෙදහසක් නොඉක්මවන තුටුපඬුරක් යම් තැනැත්තකු විසින් අයැදීමෙන්, භාර ගැනීමෙන් හෝ පිරිනැමීමෙන් ඒ වරද සංයුක්ත වන්නා වූ ද අවස්ථාවක, ඒ තැනැත්තාට විරුද්ධව මහෙස්ත්‍රාත් අධිකරණයෙහි නඩු පවරන ලෙස කොමිෂන් සභාව විසින් විධාන කළ යුතු අතර, එකී කරුණුවලින් ඒ කොටස යටතේ වරදක් අනාවරණය වන්නා වූ ද, තුටුපඬුර හෝ වටිනාකම රුපියල් දෙදහසක් ඉක්මවන තුටු පඬුරක් යම් තැනැත්තකු විසින් අයැදීමෙන්, භාර ගැනීමෙන් හෝ පිරිනැමීමෙන් ඒ වරද සංයුක්ත වන්නා වූ ද අවස්ථාවක, ඒ තැනැත්තාට විරුද්ධව අධිචෝදනා පත්‍රයක් මගින් මහාධිකරණයේ නඩු පවරන ලෙස කොමිෂන් සභාව විසින් විධාන කළ යුතු ය.

**අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අත්සන යටතේ වූ අධිචෝදනා පත්‍රයක් මහාධිකරණය විසින් භාරගත යුතු බව.**

12. (1) 11 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරන ලද විධානයක් ප්‍රකාර, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්සන් තබන ලද අධිචෝදනා පත්‍රයක් මගින්, මහාධිකරණයක නඩු කටයුතු පවරනු ලැබූ අවස්ථාවක, ඒ අධිචෝදනා පත්‍රය ඒ අධිකරණය විසින් භාරගනු ලැබිය යුතු අතර, ඒ අධිචෝදනා පත්‍රය, නීතිපතිවරයා විසින් ඒ අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද අධිචෝදනා පත්‍රයක් වූවාක් සේ සලකා, ඒ අධිචෝදනා පත්‍රයේ විස්තර කර ඇති වරද සම්බන්ධයෙන් නඩු විභාගයක් පැවැත්වීමට සෑම අංශයකින් ම ඒ අධිකරණයට අධිකරණ බලය තිබිය යුතු ය.

(2) ඒ සෑම අධිචෝදනා පත්‍රයකට ම, අමුණා තිබිය යුතු යයි 1979 අංක15 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතේ නියම කර ඇති ලේඛන වලට අමතරව, චූදිතයා විසින් සහ චෝදනා පක්ෂය සාක්ෂිකරුවකු ලෙස කැඳවීමට අදහස් කරන සෑම තැනැත්තකු විසින් කොමිෂන් සභාව ඉදිරියේ යම් ප්‍රකාශ කර ඇත්නම්, ඒ ප්‍රකාශවල පිටපතක් ද අමුණා තිබිය යුතු ය.

(3) 11 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරන ලද විධානයක් අනුව ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් බලය දෙන ලද නිලධරයකු විසින් යම් තැනැත්තකුට විරුද්ධව යම් අධිකරණයක නඩු කටයුතු පවරනු ලැබූ අවස්ථාවක, ඒ පනතේ 9 වන වගන්තියේ (5) වන උපවගන්තියේ හෝ 9 අ වගන්තියේ (ආ), (ඈ), (ඉ) සහ (ඊ) ඡේදවල හෝ ඇතුළත් කිසිවක් එවැනි යම් නඩු කටයුතු පැවරීම හෝ පවත්වාගෙන යාම කෙරෙහි අදාළ නොවිය යුතු ය.

**කොමිෂන් සභාවේ නිලධරයන්ට මහාධිකරණයේ අපරාධ නඩු මෙහෙයීමට හිමිකම ඇති බව.**

13. (1) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, කොමිෂන් සභාව විසින් බලය දෙනු ලැබූ කොමිෂන් සභාවේ නිලධරයකුට, හෝ කොමිෂන් සභාව විසින් විශේෂයෙන් බලය දෙනු ලැබූ වෙනත් යම් නීතිඥවරයකුට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්සන් තබන ලද අධිචෝදනා පත්‍රයක් මගින් වරදක් සම්බන්ධයෙන් වූ නඩු විභාගයක දී චෝදක පක්ෂය වෙනුවෙන් නඩු විභාගය මෙහෙයීමට, හිමිකම තිබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්සන් තබන ලද අධිචෝදනා පත්‍රයක් මගින් මහාධිකරණයේ නඩු කටයුතු පවරනු ලැබූ අවස්ථාවක. ඒ වරද හා සම්බන්ධ අධිචෝදනා පත්‍රයක් නීතිපතිවරයා විසින් ඒ අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබී නම්, නඩු තීන්දුවට, ආඥාවට හෝ දණ්ඩන නියමයට විරුද්ධව අභියාචනය කිරීමට නීතිපතිවරයාට අයිතිවාසිකම පවත්නා සියලු කාරණාවල දී, ඒ මහාධිකරණයේ නඩු තීන්දුවට, ආඥාවට හෝ දණ්ඩන නියමයට විරුද්ධව අභියාචනය කිරීමට, ඒ අධ්‍යක්ෂ ජනරාල්වරයාට අයිතිවාසිකම් තිබිය යුතු ය; තවද, ඒ අභියාචනය තහවුරු කිරීම සඳහා යම් අධිකරණයක පෙනී සිටීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ කොමිෂන් සභාවට සහාය වීම පිණිස පත් කරන ලද නිලධරයකු හිමිකම ලැබිය යුතුය.

**පරස්පර විරෝධී ප්‍රකාශ.**

14. (1) අල්ලස් පනත හෝ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ වූ වරදක් හා සම්බන්ධ නඩු විභාගයක දී යම් සාක්ෂිකරුවකු කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ පවත්වන ලද විමර්ශනයක් අතරතුර ඔහු විසින් යම් වැදගත් කාරණයක් සම්බන්ධයෙන් කලින් කරන ලද ප්‍රකාශයක් ප්‍රකාශිතව ම හෝ අවශ්‍ය ව්‍යංගයෙන් හෝ පරස්පර විරෝධී වුවහොත් ඒ ප්‍රකාශය, එහි වැදගත් විස්තර සම්බන්ධයෙන් ස්වාධීන සාක්ෂිකරුවකුගේ සාක්ෂියෙන් තහවුරු වන්නේ නම්, අදාළ සියලු අවස්ථාගත කරුණු අනුව ඒ ප්‍රකාශය මත ක්‍රියා කිරීම නිවැරදි හා යුක්ති සහගත බව

විනිශ්චයාසනාරූඪ විනිශ්චයකාරවරයා හෝ මහේස්ත්‍රාත්වරයා සලකන්නේ නම්, එසේ ක්‍රියා කිරීම, සහ ඒ නඩුව අවසානයේ දී, අධිකරණ නඩු කටයුත්තක යම් අවධියක දී හිතාමතා බොරු සාක්ෂි දීමේ වරද පිළිබඳ චෝදනාවක් මත හෝ ඒ අධිකරණය මහාධිකරණය නම් අධිචෝදනා පත්‍රයක් මත විනිශ්චයට ඉදිරිපත් කර, ඔහුට විරුද්ධව නඩු විභාගයක් පැවැත්වීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් නඩු විභාගයක දී අධිචෝදනා පත්‍රයේ හෝ චෝදනාවේ කියා සිටින පරස්පර විරෝධී ප්‍රකාශ චූදිතයා විසින් කරනු ලැබූ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් වන අතර, ඒ ප්‍රකාශ වලින් කවර ප්‍රකාශයක් අසත්‍ය දැයි ඔප්පු කිරීම අවශ්‍ය නොවිය යුතු ය.

(3) අවස්ථාචෝචිත යයි විනිශ්චයාසනාරූඪ විනිශ්චයකාරවරයා හෝ මහේස්ත්‍රාත්වරයා සලකන්නේ නම්, (1) වන උපවගන්තිය යටතේ වූ යම් චූදිතයකු පිළිබඳ නඩු විභාගය සුදුසු යයි ඔහු කල්පනා කරන යම් කාලයකට අඩාළව කල් තබනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවක දී ඒ නඩු විභාගය අවසන් වන තෙක් චූදිතයා සිරභාරයට නියම කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, අභියාචනාධිකරණය විසින් අතිවිශේෂ අවස්ථාගත කරුණු මත නඩු විභාගය අවසන් වන තෙක් ඒ තැනැත්තා ඇප පිට මුදා හරිනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාව වෙත කරන ලද ප්‍රකාශ අල්ලස් පනත හෝ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ වූ වරදක් හා සම්බන්ධ නඩු විභාගයක දී ආවේශ්‍ය කර ගත හැකි වීම.

15. යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ පවත්වනු ලබන විමර්ශනයක් අතරතුර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද, භාර දෙන ලද හෝ සපයන ලද—

(අ) දිවුරුම් පත්‍රයක් හෝ දිවුරුම් පිට කළ ප්‍රකාශයක් ;

(ආ) යම් පොතක්, ලේඛනයක්, චෙක්පතක්, වාර්තාවක් හෝ රෙජිස්ටරයක් හෝ ඒ කිසිවක සහතික කළ පිටපතක් හෝ ඒ යම් පොතක, ලේඛනයක, වාර්තාවක හෝ රෙජිස්ටරයක ඇති යම් සටහනක සහතික කළ පිටපතක්

අල්ලස් පනත හෝ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් පැවැත්වෙන නඩු විභාගයකට අදාළ වන හා ඒ නඩු විභාගයක දී ආවේශ්‍ය කරගත හැකි විය යුතු අතර, ඒවා ලියා අත්සන් කිරීම හා ඒවායේ අන්තර්ගත කරුණු පිළිබඳව බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

## III වන කොටස

අල්ලස් සහ දූෂණ වැළැක්වීමේ අධ්‍යක්ෂ ජනරාල් වරයා සහ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය

16. (1) මේ පනතින් කොමිෂන් සභාව වෙත පැවරී ඇති කර්තව්‍ය ඉටුකිරීමෙහි ලා කොමිෂන් සභාවට සහාය වීම පිණිස ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් විමසා, (මේ පනතේ "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අල්ලස් සහ දූෂණ වැළැක්වීමේ අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප් පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, එය ඒකාබද්ධ අරමුදලට වැය බරක් කරනු ලැබිය යුතු ය. තවද කොමිෂන් සභාවෙහි ඔහුගේ සේවා කාලය තුළ ඒ වැටුප් අඩු කරනු නොලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ බලතල අතුරින් (5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (එ), (ඒ), (ඔ) සහ (ඕ) ඡේදවල, 2 වන වගන්තියේ සහ මේ වගන්තියේ සඳහන් බලතල හැර) කවර හෝ බලයක්, අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ කොමිෂන් සභාවට සහාය වීම පිණිස පත් කරන ලද වෙනත් යම් නිලධරයකුට හෝ පවරනු ලැබිය හැකි අතර, ඒ බලතල පවරන ලද තැනැත්තා විසින් ඒ බලතල, කොමිෂන් සභාවේ විධානයට යටත්ව ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(4) මේ පනතින් කොමිෂන් සභාව වෙත පැවරී ඇති කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා කොමිෂන් සභාවට සහාය වීම පිණිස අවශ්‍ය විය හැකි වෙනත් යම් නිලධරයන් හා සේවකයන් පත් කරනු ලැබිය යුතු ය.

රහස්‍යභාවය රැකීමේ යුතුකම.

17. කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කොමිෂන් සභාවට සහාය වීම සඳහා පත් කරන ලද සෑම නිලධරයකු හෝ සේවකයකු විසින්, ස්වකීය ධුරයේ කාර්ය භාර ගැනීමට ප්‍රථම මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා හැර, මේ පනත, යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කර්තව්‍ය ඉටු කිරීමේ දී තමන්ට ලැබෙන හෝ තමන්ට දැනගැනීමට ලැබෙන තොරතුරු කිසිවක් අනාවරණය නොකරන බවට ප්‍රකාශයක්, අත්සන් කළ යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන් ආදීන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

18. (1) කොමිෂන් සභාවේ සාමාජිකයන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කොමිෂන් සභාවට සහාය වීම පිණිස පත්කරන ලද නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ පවත්වනු ලබන සෑම විමර්ශනයක් ම ඒ නීති සංග්‍රහයේ අර්ථානුකූලව අධිකරණ නඩු කටයුත්තක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කොමිෂන් සභාවට සහාය වීම පිණිස පත් කරන ලද සෑම නිලධරයකු ම, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සාම නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

නඩු පැවරීමෙන් ආරක්ෂාව.

19. (1) කොමිෂන් සභාවේ සාමාජිකයකු හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ කොමිෂන් සභාවට සහාය වීම පිණිස පත් කරන ලද යම් නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද බවට උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, අධ්‍යක්ෂ ජනරාල්වරයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව හෝ අපහාස කිරීමේ වරද සම්බන්ධයෙන් හැර කොමිෂන් සභාවට කවර හෝ ආකාරයකින් සහාය වන වෙනත් යම් තැනැත්තකුට විරුද්ධව හෝ කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) අපහාස වරදක් සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් හෝ දණ්ඩ නීති සංග්‍රහයේ XI වන පරිච්ඡේදය හෝ අල්ලස් පනත හෝ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වන නඩු කටයුත්තක කාර්ය සඳහා අවශ්‍ය පරිදි හැර, කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ පවත්වනු ලබන යම් විමර්ශනයක දී කොමිෂන් සභාවට ලැබෙන යම් ලියවිල්ලක් යම් අධිකරණයක් වෙත ඉදිරිපත් කරන ලෙස හෝ දැනගන්නට ලැබෙන යම් කාරණයක් හෝ දෙයක් යම් අධිකරණයක් වෙත හෙළිදරව් කරන ලෙස කොමිෂන් සභාවේ සාමාජිකයකුට හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ කොමිෂන් සභාවට සහාය වීම පිණිස පත් කරන ලද යම් නිලධරයකුට හෝ සේවකයකුට නියම කරනු නොලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ සපයන යම් වාර්තාවක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ සාමාජිකයකුට විරුද්ධව හෝ ඒ වාර්තාව පිළිබඳ සාරානුකූලව සත්‍ය විස්තරයක් වෙනත් යම් තැනැත්තකු විසින් පළ කිරීම සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව හෝ යම් අධිකරණයක දී කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

## IV වන කොටස

අපහාසය සම්බන්ධයෙන් දඬුවම්.

**20.** (1) කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි සිදු කරන ලද සෑම අපහාස වරදක්ම සම්බන්ධයෙන්, ඒ වරද ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි සිදු කරන ලද අපහාස වරදක් වූවාක් මෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දඬුවම් කරනු ලැබිය යුතු අතර, ඒ සෑම වරදක් ම විභාග කිරීමේ අධිකරණ බලය මෙයින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පැවරෙන්නේ ය.

(2) කොමිෂන් සභාව සම්බන්ධයෙන්, කොමිෂන් සභාව ඉදිරිපිට දී හෝ අන්‍යාකාරයකින් හෝ කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක්, ඒ කරන ලද හෝ නොකර හරින ලද ක්‍රියාව ශ්‍රේෂ්ඨාධිකරණය සම්බන්ධයෙන් කරන ලද නම් හෝ නොකර හරින ලද නම්, ඉන් ඒ අධිකරණයේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි අපහාස වරදක් සංයුක්ත වන්නේ නම්, කරන ලද හෝ නොකර හරින ලද ඒ ක්‍රියාවෙන් ඒ කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි අපහාස වරදක් සංයුක්ත වන්නේ ය.

(3) යම් තැනැත්තකු විසින්—

(අ) මේ පනත යටතේ භාර දෙන ලද සිතාසියක සඳහන් වේලාවේ දී හා ස්ථානයේ දී කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම, කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ වන හේතුවක් නොමැතිව පැහැර හරිනු ලැබුවහොත්; හෝ

(ආ) දිවුරීම හෝ ප්‍රතිඥා දීම කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ වන හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ යථා පරිදි දිවුරා හෝ ප්‍රතිඥා දෙනු ලැබ, කොමිෂන් සභාව විසින් විමර්ශනය කරන

කාරණා හා සම්බන්ධව තමා වෙත ඉදිරිපත් කරනු ලැබූ යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ පැහැර හරිනු ලැබුවහොත්; හෝ

(ඇ) කොමිෂන් සභාව විසින් තමා වෙත නිකුත් කරන ලද දැන්වීමක හෝ කරන ලද ලිඛිත ආඥාවක නියමයන් අනුව ක්‍රියා කිරීම, කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ වන හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ පැහැර හරිනු ලැබුවහොත්; හෝ

(ඈ) කොමිෂන් සභාවේ මතය අනුව, විමර්ශනය කළ යුතු කාරණාවල සත්‍යතාව නිගමනය කිරීම සඳහා අවශ්‍ය වූ ද, තම සන්තකය හෝ බලය යටතේ ඇත්තා වූ ද, යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ වන හේතුවක් නොමැතිව සභාවට ඉදිරිපත් කිරීම සහ පෙන්වීම, ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ පැහැර හරිනු ලැබුවහොත්,

ඒ තැනැත්තා කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි අපහාස කිරීමේ වරදට වරදකරු වන්නේ ය.

මේ වගන්තියේ කාර්ය සඳහා, කොමිෂන් සභාව විසින් විමර්ශනය කරනු ලබන කාරණය යම් අධිකරණයක යම් නඩු කටයුත්තක විභාග යකට විෂය වී ඇති හෝ විෂය බවට පත්වීමට ඉඩ ඇති කාරණය ම වීමේ හෝ සාරානුකූලව එම කාරණය ම වීමේ හේතුව මත හෝ යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම හෝ යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම හා පෙන්වීම, තමාට, වෙනත් යම් කටයුත්තක දී කෙළින් ම හෝ අන්‍යාකාරයකින් බල පෑ හැකි වීමේ හෝ හානිකර වීමේ හේතුව මත, යම් තැනැත්තකු විසින් යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම හෝ යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම හා පෙන්වීම ප්‍රතික්ෂේප කිරීම හෝ පැහැර හැරීම, සාධාරණ හේතුවක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(4) යම් තැනැත්තකු විසින්, කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි (2) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය යටතේ යම් අපහාස වරදක් සිදුකර ඇති බවට කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබූ අවස්ථාවක, කොමිෂන් සභාව විසින් ඒ නිශ්චය කිරීම දැක්වෙන සහතිකයක් අධ්‍යක්ෂ ජනරාල් වරයා ලවා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යැවීමට සැලැස්විය හැකි ය. ඒ සෑම සහතිකයක් ම කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි, සැලකිල්ලට ගැනීම සුදුසු යයි ශ්‍රේෂ්ඨාධිකරණය කල්පනා කරන අපහාස වරදක් සම්බන්ධයෙන් දඬුවම් කිරීම සඳහා වූ යම් නඩු කටයුත්තක දී (4) වන උපවගන්තිය යටතේ අත්සන් කරන ලද සහ අධිකරණය වෙත යවන ලද සහතිකයක් යයි කියනු ලබන යම් ලේඛනයක්—

(අ) සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතු අතර, පටහැනිව කරුණු ඔප්පු කරනු ලැබුවහොත් මිස, වැඩිදුර ඔප්පු කිරීමක් නොමැතිව එය එසේ වූ සහතිකයක් ලෙස සලකනු ලැබිය යුතු ය ; තව ද

(ආ) සහතිකයේ දක්වෙන නිශ්චය කිරීම කොමිෂන් සභාව විසින් කරන ලද බවට සහ නිශ්චය කිරීමේ සඳහන් කරුණු සම්බන්ධයෙන් සාක්ෂි විය යුතු ය.

(6) යම් කොමිෂන් සභාවක අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි වූ වරදක් යයි කියනු ලබන යම් අපහාස වරදක් සම්බන්ධයෙන් දඬුවම් කිරීම පිණිස මේ වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි පවත්වනු ලබන යම් නඩු කටයුතුවල දී කොමිෂන් සභාවේ කිසිම සාමාජිකයකු, මේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඔහුගේ කැමැත්ත ඇතිව හැර, සාක්ෂිකරුවකු වශයෙන් කැඳවීම හෝ ඔහුගෙන් ප්‍රශ්න කිරීම හෝ කරනු නොලැබිය යුතු ය.

*අසත්‍ය චෝදනා කිරීම වරදක් බව.*

**21.** 4 වන වගන්තිය යටතේ තමා විසින් කොමිෂන් සභාව වෙත කරන යම් දැනුම් දීමක අසත්‍ය බව දන දනම හෝ සත්‍යයක් නොවන බව විශ්වාස කිරීමට හේතු තිබිය දී චෝදනාවක් කරන සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩුවිභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු දහයක් නො ඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් දෙලක්ෂයක් නො ඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතුය ; තව ද එයට අතිරේකව දැනුම් දීමක් කර ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන්ද ඒ තැනැත්තා වෙත අධිකරණය සුදුසු යයි කල්පනා කරන යම් මුදලක වන්දි ගෙවීමකට ඔහු යටත් විය යුතු ය.

*රහස්‍යභාවය පිළිබඳ විධිවිධාන කඩ කිරීම වරදක් බව.*

**22.** රහස්‍යභාවය පවත්වා ගැනීම සම්බන්ධයෙන් 17 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති යුතුකම් උල්ලංඝනය වන පරිදි ක්‍රියා කරන සෑම තැනැත්තකු ම, වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

*විවිධ වැරදි.*

**23.** (අ) තමා විසින් කොමිෂන් සභාව වෙත සපයන ලද දිවුරුම් ප්‍රකාශයක අසත්‍ය ප්‍රකාශයක් කරන්නාවූ ;

(ආ) සහාය දෙන ලෙස 7 වන වගන්තිය යටතේ ඉල්ලා සිටිනු ලැබූ විට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ කොමිෂන් සභාවට සහාය වීම පිණිස පත් කරන ලද යම් නිලධරයකුට සහාය දීම ඕනෑකමින් ම නොසලකා හරින්නා වූ හෝ නොකර හරින්නා වූ ;

(ඇ) 7 වන වගන්තිය යටතේ ඇතුළුවීමේ හෝ සෝදිසි කිරීමේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි දී අධ්‍යක්ෂ ජනරාල්වරයාට, කොමිෂන් සභාවට සහාය වීම පිණිස පත් කරන ලද යම් නිලධරයකුට හෝ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් බලය දෙන ලද යම් නිලධරයකුට ප්‍රතිරෝධය දක්වන්නා වූ හෝ බාධා කරන්නා වූ ;

(ඈ) කොමිෂන් සභාව විසින් ප්‍රශ්න කිරීමට සිටින හෝ ප්‍රශ්න කරන ලද යම් තැනැත්තකුට අයුතු ලෙස මැදහත් වන්නා වූ ;

(ඉ) යම් අධිකරණයක සාක්ෂිදීමෙන් වැළකී සිටීමට එවැනි යම් තැනැත්තකු පොළඹවන්නා වූ ;

(ඊ) එවැනි යම් තැනැත්තකු යම් අධිකරණයක සාක්ෂි දීම වැළැක්වීම පිණිස ඔහුගේ ශරීරයට, සිතට හෝ කීර්තියට හානි කරන බවට තර්ජනය කරන්නා වූ ;

(උ) එවැනි යම් තැනැත්තකු යම් අධිකරණයක සාක්ෂි දීමෙන් වැළැක්වීම පිණිස ඔහුගේ ශරීරයට, සිතට හෝ කීර්තියට හානි කරන්නා වූ ;

(ඌ) එවැනි යම් තැනැත්තකුට යම් අධිකරණයක සාක්ෂි නොදීමට බලකරන්නා වූ

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු හතක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පනස් දහසක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ ඒ බන්ධනාගාරගතකිරීම හා දඩය යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

ඇතැම් කොමිෂන් සභා සම්බන්ධව රිට් ආඥා අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාත්මක කළ යුතු බව.

24. (1) කොමිෂන් සභාවට විරුද්ධව සහන ඉල්ලා සිටින ඉල්ලීම් සම්බන්ධයෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාවෙන් අභියාචනාධිකරණය වෙත පැවරී ඇති අධිකරණ බලය, අභියාචනාධිකරණය විසින් නොව, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ විමර්ශනයක් කිරීම ආරම්භ කිරීම හෝ විමර්ශනයක් පවත්වා ගෙන යාම හෝ මේ පනතින් කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීම හෝ මේ පනත යටතේ යම් විධානයක් කිරීම වළක්වන හෝ නතර කරන නැතහොත් වැළැක්වීමේ හෝ නතර කිරීමේ ප්‍රතිඵලය ඇති කිසිම ඉන්ජන්ෂන් තහනමක් හෝ වාරණ නියෝගයක් සිදුර හෝ අධිකරණයක් විසින් නොකළ යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන.

25. අල්ලස් කොමසාරිස්වරයා විසින් අල්ලස් පනත යටතේ ආරම්භ කරන ලදුව, නියමිත දිනයට ඉහතින් වූ දිනයේ දී නොනිමිව පවත්නා සියලු විමර්ශන, නියමිත දිනයේ දී කොමිෂන් සභාව වෙත පැවරෙන අතර, ඒ විමර්ශන කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලද විමර්ශන සේ කොමිෂන් සභාව විසින් පවත්වා ගෙන යනු ලැබිය හැකි ය ; තව ද අල්ලස් කොමසාරිස්වරයා විසින් පවරන ලදුව නියමිත දිනයේ දී යම් අධිකරණයක් ඉදිරියෙහි විනිශ්චයට භාජනයව පවත්නා සියලු නඩු කටයුතු, කොමිෂන් සභාවේ විධානය මත පවරන ලද නඩු කටයුතු සේ, නියමිත දිනයෙන් පසුව පවත්වා ගෙන යනු ලැබිය හැකි අතර, අල්ලස් පනත යටතේ විමර්ශන පවත්වා ගෙන යාමේ දී අල්ලස් කොමසාරිස්වරයා වෙත සපයන ලද සියලු ප්‍රකාශ සහ ලියවිලි හෝ ඒ කිසිවක සහතික පිටපතක් ඒ පනත යටතේ පවරන ලද නඩු කටයුතු වල දී, ඒ පනතේ 4 වන වගන්තියේ (ඊ) වන උපවගන්තිය එවකටත් බලාත්මකව පවත්නා සේ, ආවේශ කර ගනු ලැබිය යුතුය.

**කොමිෂන් සභාවේ වාර්තා.**

26. අවශ්‍ය යයි කොමිෂන් සභාව සලකන පරිදි නොයෙක් විට, එහෙත් එක් ලිත් වර්ෂයකට යටත් පිරිසෙයින් එක් වාර්තාවක් පිළියෙල වන සේ, කොමිෂන් සභාව විසින් එහි කටයුතු පිළිබඳ වාර්තා පිළියෙල කළ යුතු ය. එසේ පිළියෙල කරනු ලබන සෑම වාර්තාවක් ම කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරයා වෙත යැවීමට සැලස්විය යුතු අතර, ජනාධිපතිවරයා විසින් ඒ වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය. බලපැවැත්විය යුතු බව.**

27. මෙ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## V වන කොටස

**අර්ථ නිරූපණය**

28. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"අල්ලස්" යන්නෙන්, අල්ලස් පනතේ II වන කොටසේ යම් විධිවිධානයක් උල්ලංඝනය කරමින් යම් තුටු පඬුරක් පිරිනැමීම' අයැදීම හෝ භාර ගැනීම නැතහොත් එවැනි යම් විධිවිධානයක් උල්ලංඝනය කරමින් කරනු ලබන වෙනත් යම් ක්‍රියාවක් අදහස් වේ ;

"දූෂණය" යන්නෙහි අල්ලස් පනතේ 70 වන වගන්තියෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"තුටු පඬුර" යන්නට—

(අ) මුදල් හෝ යම් තෑග්ගක්, ණයක්, ගාස්තුවක්, පාරිතෝෂිකයක්, කොමිස් මුදලක්, වටිනා ඇපයක් නැතහොත් කවර හෝ විස්තරයකට අයත් චංචල හෝ නිශ්චල වෙනත් දේපළක් හෝ දේපළක සම්බන්ධතාවක් ;

(ආ) යම් ධුරයක්, රක්ෂාවක් හෝ ගිවිසුමක් ;

(ඇ) යම් ණයක, බැඳිමක හෝ වෙනත් කවර හෝ බැරකමක සම්පූර්ණ හෝ කොටස් වශයෙන් වූ යම් ගෙවීමක්, මිදීමක්, නිදහස් කිරීමක් හෝ ඇවර කිරීමක් ;

(ඈ) එවකටත් ආරම්භ කර තිබුණ ද, නොතිබුණ ද, විනිමය හෝ දණ්ඩනමය ස්වභාවයකින් යුතු නඩුවකින් හෝ නඩු කටයුතුවලින් පමුණුවා ඇති හෝ පැමිණවිය හැකි යම් දණ්ඩනයකින් හෝ අශක්නුතාවකින් ආරක්ෂාවීම ද සහ යම් අයිතිවාසිකමක් හෝ යම් නිල බලයක් හෝ කාර්යයක් ක්‍රියාත්මක කිරීමෙන් වැළකී සිටීම ද ඇතුළුව, කවර හෝ විස්තරයකට අයත් වෙනත් යම් සේවයක්, උපකාරයක් හෝ වාසියක් ; සහ

(ඉ) ඉහතින් වූ (අ), (ආ), (ඇ), (ඈ) ඡේදයන්හි අර්ථානුකූල වූ යම් තුටු පඬුරක් පිරිනැමීම, දීමට බැඳීම හෝ පොරොන්දු වීම

ඇතුළත් වේ;

''පළාත් පාලන ආයතනය'' යන්නෙන්, මහ නගර සභාවක්, නගර සභාවක්, හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇතිකොට පිහිටුවන ලද යම් අධිකාරයක් ඊට ඇතුළත් වේ ;

''පළාත් සභාව'' යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේද යෙන් පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ ;

''උපලේඛනගත ආයතනය'' යන්නෙහි අල්ලස් පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.